# නැහැ සහෝදරයා! ඒ ගැන වගකීම මගේ

භාෂා නිලධාරි නමින් ඇති කරන ලද නව තනතුරට මා යන විට සිමෙන්ති සංස්ථා ප්‍රධාන කාර්යාලය පිහිටියේ බාර්න්ස් පෙදෙසේ ය. සභාපති කුමාරස්වාමි මහතා දිනපතා ම වාගේ කාර්යාලයට පැමිණිය ද පාලනයට ඇඟිලි ගැසුවේ නැත. සාමාන්‍යාධිකාරි ආචාර්ය ජෝර්ජ් පොන්නම්පෙරුම ස්වාධීනව කටයුතු කළේ ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ දේශපාලකයන්ගේ අතවැසියන් නොව දැනුම තේරුම ඇති උගතුන් සිටි බවය සිහිපත් කළ හැක්කේ.

කන්කසන්තුරේ සිමෙන්ති කම්හල් කළමනාකරු පදවිය දරමින් සිටි ආචාර්ය පොන්නම්පෙරුම කොළඹ පැමිණ ඇත්තේ පනස් අටේ ජාතිවාදී කලබල සමයේ ය. ඉන්පසු සිංහලයකු ඒ තනතුරට නොයනු ඇතැයි බොහෝ දෙනා සිතුව ද, හැත්තෑව දශකයේ ජී.ඩබ්ලිව්.විතානගේ එම තනතුරට පත් කරන ලද්දේ ශ්‍රී ලංකා රජය යටතේ ය. නවසිය හැත්තෑ හතේ ආණ්ඩු පෙරළියෙන් අනතුරුව සභාපති ධුරයට පත් අසෝක සෝමරත්න යටතේ ඔහුගේ එහි සේවාව හමාර විය. විතානගේ යුගයේ සෝමරත්න යටතේ සිංහල කම්කරුවන් දෙසිය දෙකනුවත් එහි සේවයේ සිටි බව ද දනිමි.

රුහුණු සිමෙන්ති කම්හල පිළිබඳ සංකල්පය ආචාර්ය පොන්නම්පෙරුම විසින් හඳුන්වා දෙන ලද්දකැයි සිතමි. ඒ පිළිබඳ ඔහුගේ උනන්දුව දියුණු වනනට පනස් අටේ අත්දැකීම් ද හේතුවූ බව බොහෝ දෙනාගේ මතය විය. හුණුගල් සහ මැටි පිළිස්සීමෙන් ගන්නා ක්ලින්කර් ගාල්ලට ප්‍රවාහනය කොට ඇඹරීමට පිහිටවූ මේ යන්ත්‍රාගාර කන්කසන්තුරේ පමණක් නොව කොළඹ ද සිටි දෙමළ නිලධාරීන් සහායට ලක් කළේ උතුරේ පිසින ලද බත බෙදන්නට දකුණට ගෙන යාමක් ලෙසට ය. සිමෙන්ති නිෂ්පාදනයෙන් සුළු ප්‍රමාණයක් ගාල්ලට ගෙනෙන අතර, දෙමළ ජනතාවට මුළුමනින් ම වාගේ සීමා වූ අඩවියෙන් බැහැර පුත්තලමේ දෙවැනි සිමෙන්ති කම්හල පිහිටුවීමත් ආචාර්ය පොන්නම්පෙරුමගේ විශේෂ අවධානයට යොමුවූ ව්‍යාපාරයකි.

සිමෙන්ති කර්මාන්තය ව්‍යාප්ත කිරීමේ මෙම ප්‍රයත්නයට අයත් අංගයක් වශයෙන් සාමාන්‍යාධිකාරී බලාපොරොත්තු වූ ප්‍රවාහ සේවය සිහිනයක් පමණක් විය. කන්කසන්තුරේ සිට ගාල්ලට ක්ලිනකර් ප්‍රවාහනය සඳහා නැවක් සංස්ථාවට ගැනීමටත් ආපසු ගමනේ දී යාපනයට අවශ්‍ය භාණ්ඩ එමඟින් ගෙන යාමටත් යෝජිත වැඩසටහන පිළිබඳ විදේශ සමාගමක් විසින් සපයන ලද වාර්තාවක් ද තිබුණ බව දනිමි. පසුව බාර්න්ස් පෙදෙසේ කාර්යාලයක සහ විජයරාම මාවතේ පිහිටි වාණිජ අංශ කාර්යාලය ද කොල්ලුපිටියේ ගාලුපාරේ භූමි භාගයකට ගෙන ගිය පසු ද සාමාන්‍යාධිකාරි තවත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළේ ය. අමාත්‍යාංශයේ පරිහරණයට පමණක් නො ව කාර්මික සංස්ථා මූලස්ථානයට ද ඉඩ සලසන ආකාරයේ ගොඩනැගිලි සංකීර්ණයක් එහි ඉදිකිරීම සඳහා වූ එම අදහස ද ඉන් ඉදිරියට ගියේ නැත. භූමි භාගයේ ඉඩකඩ තිබීම පමණක් ප්‍රමාණවත් නො වීය.

මා සේවය කළේ ලේකම් යටතේ ය. ප්‍රධාන සේවක මණ්ඩල නිලධාරී තනතුර ද ඔහුගේ තනතුරට ම ඇතුළත් විය. තනතුර දැරූ කනගසබාපති මහතා බාහිර ආටෝපය රහිත අවංක මිනිසකු ලෙසට ය මා දුටුවේ. වසර දෙකකට පමණ පසු කාර්යාලය කොල්ලුපිටියේ තිබිය දී වෙනම ප්‍රධාන සේවක මණ්ඩල නිලධාරියකු බඳවා ගැනීමට තීරණය කළේ එවකට සභාපති වූ ජී.වී.පී. සමරසිංහ මහතා ද සාමාන්‍යාධිකාරි ද යන්න නො දනිමි. එම තනතුර ඇති කිරීමේ තීරණය කනගසබාපති මහතාගෙන් ඇහිල්ලක් බැල්ල්ලක් නැතිව ගන්නක් බව මා වටහා ගත්තේ ඔහුගේ ප්‍රතිචාරය නිසා ය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට අනිවාර්යයෙන් අයත් විය යුතු ඔහු එයට සහභාගි වූයේ නැත. අවසාන මොහොතේ අවශ්‍ය ලියකියවිලි මා අතට දී මා පිටත් කර යැවුවේ ඒ නිසා ය. මම සභාපතිගේ කාර්යාලයට ගොස් පසෙකින් වාඩිවී සිටියෙමි. සභාපති සාමාන්‍යාධිකාරී දෙදෙනා සම්මුඛ පරීක්ෂණය පැවැත්වූහ. තනතුරට තෝරා ගනු ලැබුවේ කනකරත්නගේ සොහොයුරා ය. පරීක්ෂණය හමාර වූ මොහොතේ සමරසිංහ මහතා අවවාදයක් දුන්නේ ය.

''තෝරා ගැනීම රහසක් කොට තබා ගත යුතුය.''

මා දේව රසක් ලෙසින් රැක ගත් එම තීරණය තෝරා ගනු ලැබූ අපේක්ෂකයාගේ කණට වැටෙන්නට පැයක්වත් ගත නොවූ බව දැන ගත්තේ කලකට පසුවය. ලංගමයේ සහකාර පිස් නොහොත් සේවක මණ්ඩල නිලධාරියකු ව සිටි ඔහු එතැනින් පිට කර ගනු වස් ඉස්තරම් රෙකමදාරුවක් දෙන ලද බවත්, පසුව ආරංචි විය. ඒ නිර්දේශය නැතිවත තනතුර හිමිකර ගැනීමේ ශක්තිය ඔහුට තිබිණැයි සිතමි. කාර්යාල සහකාර එන්.ඩී.ප. සේනානායක සහකර තනතුරට කැමැතිදැයි ආචාර්ය පොන්නම්පෙරුම මගෙන් විමසූ විට ප්‍රතික්ෂේප කළේ ඇයිදැයි මට සිතා ගත නොහැක. කැමති වී නම් මගේ ගමන් මඟ වෙනස් වන්නට ද තිබුණි.

මට කලින් සංස්ථාවට බැඳී සිටි ක්‍රම හා විධි නිලධාරි කේ. ෂන්මුගරත්නම් සරසවියේ මට වඩා ජ්‍යේෂ්ඨ ශිෂ්‍යයෙක් විය. දර්ශන පිළිබඳ විශේෂ උපාධිලාභියකු වූ ඔහු ඉන් පසු මිය යන තෙක්ම මගේ හිතවතෙක් හා උපදේශක ද වූයේ ය. ප්‍රධාන සේවක මණ්ඩල නිලධාරි තේරීමේ සම්මුඛපරීක්ෂණයේදි දෙවැනි තැනට තේරුණේ ඔහුය. වසර දහයකට පසු ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයට බැඳෙන්නට මා පෙළඹවූයේ ද ඔහු ය. බාර්න්ස් පෙදෙසේ කාර්යාලය තිබියදී කාර්යාල සහකාර නිලධාරියකු වූ මොරීන් පෙරේරා සිටි කාමරයේම ය. මා සිටියේ විධායක නිලධාරිකුට මුල් නම කියා අමතනු පළමු කොට මා දුටුවේ එහිදී ය. ඇය යටතේ සිටි ලිපිකරුවන් හා ලිපිකාරියන් සියලු දෙනාම ඇය ඇමතුවේ නමින් ය. ඒ චාරිත්‍රය අනෙක් අයට රිසි නොවී ය. ඉන් පසු වුව ද එය මා දැක ඇත්තේ විරල වශයෙනි. එයට ඉඩ දුන්නේ ද විරල පුද්ගලයෝ ය. සංස්ථාව තුළ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම භාෂා නිලධාරි සතු මූලික කාර්යය වූයේ ය. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා සහ වැදගත් ලිපි ලේඛන සිංහලට පරිවර්තනය කිරීම එහි කොටසක් විය. කියවූ කෙනෙක් ඇද්ද යන්න සැකසහිත වුවද පොතේ හැරිට එය කළ යුතු වූවක. පොතේ හිටියට කළ යුතු දේ මඟ හැරීමේ ක්‍රම ද අනාවරණය කරගෙන තිබුණි. ''සිංහල මුල් පිටපත පසුව එවනු ලැබේ'' යන පාඨය උඩින් ම සටහන් කොට ඉංගිරිසියෙන් ලිපි යැවීම එහිලා යොදා ගත් ශාස්ත්‍රානුකූල විජ්ජාවය. මුල් පිටපත එන තෙක් නොබලා ඉල්ලීම ඉටු කිරීම පහසු විය. කිසි දිනක නොඑන කිසිවකු නොදුටු මුල් පිටපත් බහුල වූ බව නම් දනිමි. ඇපෙන් ගැලවීමට හෝ කළ යුතු සිංහලකරණය දිගට පවත්වා ගනු වස් සිංහල ලඝු ලේඛිකාවක ද බඳවා ගතිමු. දුර දිග දැකීමේ හැකියාව සහිත ඒ දැරිය ඉංගිරිසි ලඝු ලේඛනය ද ප්‍රගුණ කළාය. කලකට පසු මා ජිනීවා නුවරට යන විට එහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවයේ යෙදී සිටින්නට ඇය සමත් වූයේ ඒ නිසා ය.

නිලධාරින්ට සිංහල ඉගැන්වීම ද මගේ රාජකාරියේ කොටසක් විය. උසස් නිලධාරීන් බොහෝ දෙනෙක් දෙමළ ය. සිංහල හොඳින් කතා කරන්නට සමත් වූයේ ෂන්මුගරත්නම් පමණකි. හොඳ සිංහලෙන් කාරුණික වචනයෙන් හා ස්වරයෙන් සුළු සේවකයන් ඇමතීම ඔහුගේ විශේෂ ලක්ෂණයක් විය. සිංහල පන්තිවලට අනෙක් උසස් නිලධාරීන් පැමිණියේ මට වුවමනාවට මුත් ආසාවකින් නො වේ. මගේ සිංහල පන්ති වැඩි දොහක් ඇල්ලා නො සිටින්නට මූලික හේතුව එයය. දෙතුන් වතාවක් කන්කසන්තුරේට ද ගොස් පන්තියක් දෙකක් පැවැත්වීමි. කන්කසන්තුරේ අත්දැකීම වැදගත් වනුයේ සිංහල නිසා නොවේ. දෙමළ ජනයා පිළිබඳ මා නොදුටු පැත්ත දැක ගන්නට ලැබීම නිසා ය. රාත්‍රි තැපැල් දුම්රියේ නිදන මැදිරියක් අල්ලා ගෙන එහි යන මම දින දෙකක් වත් එහි රැඳී සිටියෙමි. පළමු වතාවේ එහි යන්නට පෙරාතුව මගේ හිතවත් ෂන්මුගරත්නම් මගේ නවාතැන් පහසුව ගැන උපදෙස් දුන්නේ ය. සංචාරක බංගලාවකට වඩා ඒ අසලම වූ නිලධාරි නිවසය හිතකර බවත්, එය බාර ව සිටි සයිමන් නමැති සේවකයා හොඳින් නිලධාරීන්ට අවශ්‍ය දේ සලසන බවත් කී නිසාය. මා එතැන නවතින්නට තීරණය කළේ, දිවා භෝජනය සඳහා ද කම්හලේ නිළධාරීන් කිහිප දෙනෙක් එතැනට එන්නට පුරුදුව සිටියහ.

ෂන්මුගරත්නම් නිර්දේශයේ පදනම මට හෙළි කළේ කන්කසන්තුරේ පැරණි රියැදුරෙකු වූ කන්දයියා ය. සිතා මතා කළ දෙයක් නොවේ. වතුර පොදක්වත් බොන්නට තමා සංචාරක බංගලාවට නොයන බව ඔහුගෙන් කියැවිණි. සංචාරක බංගලා බාරකරු කන්දයියා සහ මගේ මිතුරු ෂන්මුගරත්නම් වෙල්ලාල කුලයේය. සංචාරක බංගලාවේ කන්දයියා කුලවතුන්ගේ ගෙයකට වද්දා නොගන්නා කුලයකට අයත් වූවෙකි. ගණකාධිකාරී සෙල්වරත්නම් දිවා භෝජනය සඳහා නිලධාරි නිවාසයට පිය නගද්දී අනෙක් ගණකාධිකාරියා වූ කුමාරස්වාමි සංචාරක බංගලාවට ගියේ එම පංගු පෝරුව මත ය. රහස අනාවරණය වූ පසු ෂන්මුගරත්නම්ට නොදන්වා ම මම කන්දයියාගේ බංගලාවට යන්නට පුරුදු වූයෙමි. වායු සමීකරණය කරන ලද කාමරයක් ද සහිත එය වඩා සැපපහසු ඇති තැනකි. එවකට කර්මාන්තශාලා කළමනාකරු වූයේ ආචාර්ය වී. පෙරම්බලම් ය. කාර්යාලයේ වැඩ නිමා කොට සංචාරක බංගලාවට එනු වස් කාර්යාල වාහනය එන තෙක් දොරකඩ බලා සිටින මා ඉදිරියේ තමාගේ රිය නවත්වා දිනක් ආචාර්ය පෙරම්බලම් මා නංවා ගත්තේ ය. මා රියෙන් බස්වමින් ම මට අවවාදයක් ද දුන්නේ ය.

''අයියෝ, මෙහාට ආව ම එක එක් කෙනාගේ ගෙවල්වලට යන්න එපා. කම්මැලි නම් කතා කර කර ඉන්න මගේ ගෙදරට එන්න.''